# Abstract 13

# ගබ්සාව පිළිබඳ බෞද්ධ ආකල්පය

**ඩබ්. කේ. ඩී. අසේල සම්පත් විජේතුංග,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර-බෞද්ධ සංස්කෘතිය),
*aselawijethunga11@gmail.com*

**ගබ්සාව (Abortion)** යන දරු ප්‍රසූතිය සම්බන්ධ වෛද්‍ය විද්‍යාත්මක ක්‍රියාවලිය සංස්කෘත භාෂාවෙහි **ගර්භාක්ෂ** නමින් ද සිංහල භාෂාවේ **ගැබ් හෙළීම** නමින් ද හැඳින්වේ. මෙහි දී සිදුවන්නේ බිහිවීමට සිටින දරුගැබ් නැති කිරීමේ ක්‍රියාදාමය යි. බෞද්ධ ආගම ප්‍රධාන ආගම වශයෙන් ක්‍රියාත්මක වන රටක ගබ්සාව යහපත් ක්‍රියාවක් ලෙස නීති සම්පාදනය කිරීමට ඇතැම් පාර්ශ්වවල අවධානය යොමුව පවතින පරිසරයක බුදුන් වහන්සේ ඒ පිළිබඳව දැක්වූ අදහස විමසා බැලීම ප්‍රයෝජනවත් වේ. **වෛද්‍ය විද්‍යාවට** අනුව ගබ්සාවේ ස්තර දෙකක් 1. **ස්වාභාවික ගබ්සාව** 2. **සාපරාධී ගබ්සාව** වශයෙන් ඇත. **ස්වාභාවික ගබ්සාව** යනු ප්‍රජනනයෙන් පසු ඇතැම් අවස්ථාවල යම් යම් සවිඥානක හෝ අවිඥානක හේතු නිසා කලලයක් හට නො ගන්නා තත්ත්වයක් ඇතිවීම යි. **සාපරාධී ගබ්සාව** යනු බාහිර බලපෑම් මඟින් කලලය සම්පූර්ණ වීමට පූර්වයෙන් ඉවත් කිරීම යි. වර්තමානය වන විට ලෝකයේ ඇතැම් රටවල ගබ්සාව නීතියෙන් අනුමත ක්‍රියාවකි. එහෙත් ලංකාවේ එය දඬුවම් ලැබිය යුතු වරදකි. එහෙත් සාධාරණ හෝ අසාධාරණ හෝ යම් යම් හේතු නිසා සිදුවන ලිංගික ක්‍රියා නිසා ඇති වන ගැබ් ගැනීම්වලට (ගබ්සාව නීතිමය වරදක් වන නිසා) සාපරාධී ප්‍රතික්‍රියාවන් දක්වන බව ඉතා ප්‍රකට කරුණකි. මව සියදිවි හානි කරගැනීම, අක්‍රමවත් ගබ්සා හේතුවෙන් වන මාතෘ මරණ, දරුවන් මරා දැමීම්, දරුවන් විකිණීම් හා අතහැර දමා යාම් වැනි සාපරාධී ක්‍රියාවන් දිනෙන් දින බහුල වේ. දරු ගැබක් විනාශ කිරීම සඳහා බෙහෙතක් දුන් අවස්ථාවක් **පාරාජිකපාළියේ** දක්නා ලැබේ. කාන්තාවන් **ගබ්භපාතනය** (ගැබ් හෙළීම), **ගබ්භපතිට්ඨාපනය** (ගැබ් පිහිටුවා ගැනීම) ආදිය පිණිස ඖෂධ ලබාගත් බව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වේ. මෙහි දී ඇතැම් කාන්තාවන් මරණයට පත්වූ බව ද සඳහන් වේ. ගබ්සාව සිදුකිරීම පුද්ගලයාගේ සාංසාරික ජීවිතය කෙරෙහි බලපාන ආකාරය **පඤ්ච පුත්‍රඛාදක පේතවත්ථුව** මඟින් විස්තර කර තිබේ. කෙසේවුවත් මෙහි දී සලකා බැලෙන්නේ සහේතුක පසුබිමක දී ගබ්සාව බුදුදහම අනුව ප්‍රාණඝාතයක් වේද යන්න යි.

**ප්‍රමුඛ පද :** ඉන්දක සූත්‍රය, ගබ්සාව, පාරාජිකපාළි, පේතවත්ථුව, ප්‍රාණඝාතය